# 6

# ලාංකේය ජන රංග කලාව සමාජ කාර්යය හා තදානුබද්ධව විකාශනය වීම පිළිබඳ විමසුමක්

ගයත්‍රී කාවින්දයා එස්.ඒ.

**සංක්ෂේපය**

මෙම ශාස්ත්‍රීය ලිපිය මගින් අවධානය යොමු කරනු ලබන්නේ ලාංකේය ජන රංග කාලාව සමාජ කාර්යය හා තදානුබද්ධව විකාශය වීම පිළිබඳවයි. කලාව වූ කලී යමෙකු තමා ලද අනුභූතියක් චලන, රේඛා වර්ණ, ශබ්ද හෝ වචන මගින් ඉදිරිපත් කිරීම බව ලියෝ තෝල්ස්තෝයි සඳහන් කරයි. ප්‍රාකෘතික කලා, ගැමි කලා, ව්‍යවහාරික කලා, දෘශ්‍ය කලා, ප්‍රාසංගික කලා, මූර්ති කලා යනාදී වශයෙන් කලා ප්‍රවර්ගයෝ රාශියකි. ජන රංගය වූ කලී ප්‍රාසාංගික කලාවකි. ජනයා සහ රංගය සමායෝගයෙන් ජන රංගය බිහි වේ. ඒ අනුව සොකරිය, කෝළම් රංගය, කවි නාඩගම, පාස්කු නාට්‍ය සහ වීදී නාට්‍ය ජන රංග කලා ගණයට අයත් වේ. විවිධ කාල පරාසයන් තුළ බිහිවූ මෙම ජන රංග කලාවන් විකාශය වීමෙහිලා සමාජ කාර්යයේ උපයෝගීතාව කෙබඳු ද යන්න අප පර්යේෂණය ප්‍රස්තුතයෙන් විමසා බැලෙයි. ඒ අනුව ලාංකේය ජන රංගකලාව විකාශය වීමට සමාජ ාර්යයන් ඉවහල් වී ඇති බව උපන්‍යාස කොට ගති. ඓතිහාසික පර්යේෂණ ක්‍රමවේදය මේ උදෙසා භාවිත කරන ලදී. ප්‍රාථමික සහ ද්විතික මූලාශ්‍රය මෙන්ම සම්මුඛ සාකච්ඡා සහ නිරීක්ෂණ ඔස්සේ දත්ත එක්රැස් කරන ලද අතරම දත්ත විශ්ලේෂණයේදී ගුණාත්මක දත්ත විශ්ලේෂණ ක්‍රමයක් වන තේමා අන්තර්ගත විශ්ලේෂණ ක්‍රමය උපයෝගීකොට ගන්නා ලදී. ලාංකේය ජන රංග කලාව පිළිබඳ අධ්‍යයනය මෙන්ම නූතන සංස්කෘතික වෙනස්වීම් ජන රංග කලාව උදෙසා බලපාන අයුරු අධ්‍යයනය කිරීම අප පර්යේෂණ ප්‍රස්තුතයේ අරමුණු වේ. පූර්වෝක්ත සඳහන් ජන රංග සමාජ කාර්යය හා තදානුබද්ධව විකාශනය වූ අයුරු පැතිකඩ කිහිපයක් ඔස්සේ විද්‍යමාන වේ. ඒ වනාහි ආගමික කාර්යයන් හා තදානුබද්ධ වීම, සාමාජයීය වෘත්තීන්, සමාජ ස්ථරායනය, ගැමි ජන විශ්වාස හා ඇදහිලි ක්‍රම, සමාජ විපර්යාසයන් මෙන්ම සමාජ සන්නිවේදනය යනාදී පැතිකඩයි. ඒ අනුව පර්යේෂණයේ සමස්තය දෙස විචාරාක්ෂිය යොමු කිරීමේදී අතීතයේ පැවති සාම්ප්‍රදායික ජන රංග කලාවන් තත්කාලීන යුගයේ සමාජයීය අවශ්‍යතාවයන්ට සරිලන සේ නිර්මාණය කරගත් අතරම සමාජ සංස්කෘතික පරිණාමයේදී නූතන සමාජ වෙනස්වීම් උකහා ගනිමින් පෝෂණය වෙමින් ප්‍රේක්ෂකයා ආනන්දයෙන් ප්‍රඥාව කරා ගෙනයනු ලබන අනගිභවනීය නිර්මාණයන් බව නිගමනය කල හැකිය.

**ප්‍රමුඛ පද :** ජන රංගය, වෘත්තීන්, ආගමික සංස්කෘතිය, ජන සංස්කෘතිය, සන්නිවේදනය

**හැඳින්වීම**

යමෙකු යම් වේදිතයක් විඳ ගැනීමෙන් පසුව චලන, රේඛා, වර්ණ, ශබ්ද හෝ වචන සංයෝග මගින් ඒ වේදිතය ඒ අයුරින්ම අන්‍යයන් තුළද දැනවීම කලාවේ කාර්යය බව ලියෝ තෝල්ස්තෝයි සඳහන් කරයි.(සුරවීර,1987:06) කලාව වූ කලී එකම වේදිතයක් තුළින් මිනිසුන් සුසංයෝග කෙරෙන මාධ්‍යයක් වන අතර මිනිසාගේ පැවැත්ම සහ අභිවෘද්ධිය සඳහා අත්‍යවශ්‍ය මාධ්‍යයකි. ලොව විවිධ වර්ගයන්ට අයත් කලා ප්‍රවර්ගයෝ වෙති. ප්‍රාකෘති කලා, ජන කලා, ව්‍යවහාරික කලා, ශ්‍රව්‍ය කලා, දෘශ්‍ය කලා, ප්‍රකාශනවාදී කලා, ප්‍රාසංගික කලා, මූර්ති කලා වනාහි ඒ අතුරින් කිහිපයකි. ජන රංග කලාව වූ කලී ප්‍රාසාංගික කලා ප්‍රවර්ගයකි. ජනයා සහ රංගනය එක්තැන් වූ විට ජන රංගය බිහි වේ. එබැවින් ජන රංගයේ මූලයන් පවතිනුයේ සමාජය තුළය. සමාජයක් වනාහි විවිධ සංස්කෘතීන්ට අනුගතව සිය ජීවන ක්‍රමය නිර්මාණය කරගත් ජන කණ්ඩායම්හි ඒකරාශී වීමකි. සමාජයක් අනවරතයෙන් පරිණාමයට බඳුන් වන බැවින් ඊට අනුකූලව සංස්කෘතීන් ද නිරායාසයෙන්ම පරිණාමයට බඳුන් වේ. ජන රංගයේ උපත සිදුවන්නේ කිසියම් ජන සමාජයක සාමාජිකයින්ගේ විවිධ අභිප්‍රායයන් අතර ඇතිවන සංඝටන තුළින් මතුවන අවස්ථාවන් ලෙසිනි. ඒ වනාහි ජීවන අරගලය, උසස්වීම්, ආරක්ෂා වීම්, විශිෂ්ට ක්‍රියා, අවකල් ක්‍රියා, මානසික පීඩා යනාදී වශයෙන් මූලික මිනිස් අභිප්‍රායන් ඔස්සේ ය. මේවා සාමාජයීය හා භෞතික පරිසරය මෙන්ම පුද්ගල තත්ත්වයට සාපේක්ෂව එකිනෙකට වෙනස් ය.

**ක්‍රමවේදය**

මෙහිදී අධ්‍යයන ක්‍රමවේදය වශයෙන් පුස්තකාල අධ්‍යයනය සහ ක්ෂේත්‍ර අධ්‍යයන යන ක්‍රමවේද භාවිත කෙරිණ. ඒ අනුව පුස්තකාල අධ්‍යයනය ඔස්සේ සාහිත්‍ය විමර්ශනයට අදාළ තොරතුරු එක්රැස් කරන ලදී. කොළඹ මහජන පුස්තකාලය, සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයීය පුස්තකාලය පරිහරණය කොට කලාව අර්ථකථනය පිළිබඳ, කලා ප්‍රවර්ග පිළිබඳ, ජන රංගය පිළිබඳව පවත්නා මූලධර්ම සහ ඓතිහාසිකමය තොරතුරු විමර්ශනය කරන ලදී. ක්ෂේත්‍ර අධ්‍යයන යටතේදී නිරීක්ෂණ සහ සම්මුඛ සාකච්ඡා ඔස්සේ දත්ත එක්රැස් කරන ලදී. හොරණ ශ්‍රීපාලි රඟහලේ පැවැත්වූ සොකරි නාටකයත්, හොරණ මහජන ක්‍රීඩාංගනයේ පවත්වනු ලැබූ කෝලම් රංගයත්, පයාගල මීසමේ පාස්කු නාට්‍යයත්, සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ පැවැත්වූ වීදි නාට්‍ය නිර්මාණත් කෝළම් නාටකයත් නිරීක්ෂණයට බඳුන් කෙරිණ. එමෙන්ම විෂය ප්‍රවීණයන් සමග සම්මුඛ සාකච්ඡා පවත්වමින් තවදුරටත් දත්ත එක්රැස් කෙරිණ. දත්ත විශ්ලේෂණයේදී ගුණාත්මක දත්ත විශ්ලේෂණ ක්‍රමයක් වන තේමා අන්තර්ගත විශ්ලේෂණ ක්‍රමය උපයෝගීකොට ගන්නා ලදී.

**ප්‍රතිඵල සහ සාකච්ඡාව**

පහතරට ප්‍රදේශය ආශ්‍රිතව පවත්වන කෝලම්, උඩරට ප්‍රදේශය මූලික කරගනිමින් පවත්වන සොකරි, කතෝලික ආගම හා බැඳි පාස්කු නාට්‍ය, කුරුණෑගල ප්‍රදේශයේ ව්‍යාප්තව පවතින ජහුටා රංගය, කවි නාඩගම්, උතුරු නැගෙනහිර ප්‍රදේශවල ව්‍යාප්තව පවතින

තෙරුක්කූත්තු යනාදිය ලාංකේය ජන රංග කලා ගණයෙහිලා සැලකිය හැකිය. **සොකරි රංගය** සාම්ප්‍රදායික සිංහල නාටක අතුරෙන් ඉපැරණිම රංගය වශයෙන් පිළිගැනේ. කිසියම් කතාවකට අනුව සිදුවීම් ගොනුකර ගනිමින් නාටකීය පෙළගැස්මක් සහිතව ඉදිරිපත් කරන්නට දේශීය පැරණි නාට්‍ය ශිල්පියා දැරූ උත්සාහයක ප්‍රතිඵලයක් වශයෙන් ද සොකරි නාටකය හඳුන්වා දිය හැකිය. ඇතැම් ලක්ෂණ අතින් සොකරිය හා ද්‍රවිඩ නාට්ටුකූත්තුව අතර සම්බන්ධයක් ඇති බව විද්‍යමාන වේ යනුවෙන් මුදියන්සේ දිසානායකයන් පවසයි.(දිසානායක,2012:278) සොකරි නාටකය උඩරට ප්‍රදේශය කේන්ද්‍රකොට ගනිමින් ව්‍යාප්ත වූ ජන රංග වෙසෙසකි. කමත රංග භූමිය ලෙස යොදාගනිමින් අනුරූපණ මාධ්‍යයෙන් කතාවක් ඉදිරිපත් කිරීම මෙහි මුඛ්‍ය ලක්ෂණයයි. එමෙන්ම ලක්දිව දකුණු පළාතේ මුහුදුබඩ ප්‍රදේශවල ව්‍යාප්ත වූ ජනප්‍රිය ජන රංගයක් වශයෙන් **කෝලම් නාටකය** හැඳින්විය හැකිය. ඉතා විශාල වෙස්මුහුණු ප්‍රමාණයක් භාවිත කෙරෙන කෝලම් මඩුව තුළදී විවිධ චරිත හා කතා ප්‍රවෘත්තීන් රාශියක් රඟදක්වනු ලැබේ. විවිධ කාල වකවානුවලදී කෝලම් රංගයට එක් වූ නවාංග රාශියකි. ලංසි කෝලම, කරපිට කෝලම, අරක්කැමි, සුද්දා, පොලිස් යනාදිය ඊට නිදසුන් ය. එබැවින් කෝලම් වූ කලී තත්කාලීන සමාජය පිළිබිඹු වන කැඩපතක් බඳුය. කෝලම් සොකරි මෙන්ම ලාංකේය ජන රංග අතර ප්‍රචලිත වූ **කවි නාඩගම** ද සුවිශේෂී රංග වෙසෙසකි. කවි නාඩගමෙහි සංවාද සියල්ල කවියෙන්ම සිදුකරන අතර එහි නාටක පෙළ කාව්‍යකරණයෙහි දස්කම් පෑ ජන ගීතයෙහි හුරුපුරුදු ඇත්තවුන් විසින් රචනා විණ. කවි නාඩගම, නාඩගමට වඩා යක් තොවිල් හා කෝලම් ආශ්‍රය කොට ගනිමින් විකාශනය වූ බව ගුණදාස ගලප්පත්ති මහතාගේ අදහසයි. (දිසානායක,2009:143) සඳ කිඳුරු, මනමේ ආදී කථා වස්තුන්ගෙන් කවි නාඩගම සමන්විත වූ අතර පසුකාලීනව ඊට ස්වර්ණතිලකා කතාව, මහා පදුම ජාතකය, කාපිරි කතාව යනාදී අංගයන් එක්විය. මධ්‍යකාලීන යුගයේ ජනයා රංගය සමග ඒකාත්මික වීම සමගම කතෝලික ආගම හා සම්බන්ධ විවිධ කතා වස්තු බීජ කරගනිමින් නාට්‍ය රඟ දක්වන්නට වූහ. විවිධ මූලයන්ගෙන් ආභාසය ලැබ මෙරට බිහි වූ ජන රංග ශෛලීන් අතුරින් **පාස්කු නාට්‍ය** වනාහී කතෝලික ආගමේ ආභාසය ලැබ ව්‍යාප්ත වූ රංග ශෛලියකි. කතෝලික පාස්කු නාට්‍ය මුල්කාලයේ දී රූකඩ මාර්ගයෙන් රඟ දැක්වුව ද පසුකාලීනව පාත්‍රවර්ගයා ඊට සහභාගී විය. පාස්කු නාට්‍යයේ රංග භූමිය පාස්කු මඩුවයි. එමෙන්ම විවිධ කණ්ඩායම් මගින් විරෝධාකල්ප ප්‍රකාශ කිරීම සඳහා වීදියේ සිට ඉදිරිපත් කළ විප්ලවීය ගීත ගායනා හා නාට්‍යාත්මක ක්‍රියාකාරකම් මුල්කරගෙන වීදි නාට්‍ය කලාව හටගත් බව පිළිගැනෙයි.(සේනානායක,2015:97) නාට්‍යමය ප්‍රකාශනයක් ලෙස **වීදි නාට්‍ය** එයටම ආවේණික වූ නිදහස් ආකෘතියක වැඩි විවිධ වෙනස්වීම්වලට ලක්වෙමින් පවතින කලා මාධ්‍යයකි. 1970 දශකයේ ශ්‍රී ලාංකේය සමාජ දේශපාලන හා ආර්ථික ක්ෂේත්‍රයන්හි ඇති වූ විපර්යාස මෙරට වීදි නාට්‍ය කලාව ආරම්භයට පසුබිම් වූ බව විද්‍යමාන වේ.

පූර්වෝක්ත සඳහන් ජන රංග සමාජ කාර්යය හා තදානුබද්ධව විකාශනය වූ අයුරු පැතිකඩ කිහිපයක් ඔස්සේ සාකච්ඡාවට බඳුන් කළ හැකිය. ඒ වනාහි ආගමික කාර්යයන් හා තදානුබද්ධ වීම, සාමාජයීය වෘත්තීන්, සමාජ ස්ථරායනය, ගැමි ජන විශ්වාස හා ඇදහිලි ක්‍රම, සමාජ විපර්යාසයන් මෙන්ම සමාජ සන්නිවේදනය යනාදී පැතිකඩයි. ථෙරවාදී බුදුදහමේ ආගමනය ලාංකේය සමාජ සංස්කෘතියට මෙන්ම කලා ශිල්පවලට ද විශාල බලපෑමක් ඇති කළ බව අවිවාදිතය. පශ්චාත් බෞද්ධ සමයේ දී ලාංකේය කලා ශිල්පයන් එකී ආභාසය මත විකාශනය විය. කෝලම් ආරම්භයේ දී තුණුරුවන් හා දෙවියන් වෙනුවෙන් මල් යහන් පිදීම සිදුකරන අතරම තුණුරුවන් නමස්කාරය හා දේවාරාධනාව සිදුකරයි. සොකරි සහ කවි නාඩගම ආරම්භයේ දී ද තුණුරුවන්ගේ ආශිර්වාද ලබාගනියි.

ගැමියා ඇදහූ බුදුසමය තුළ විවිධ කලා ශිල්ප, දේව වන්දනා ඇතුළත් වූ අතර පූර්වෝක්ත බෞද්ධ සංස්කෘතියෙන් පෝෂිත වූ සිංහල ජනයා සෑම කටයුත්තකදීම තම ආගම ධර්මය මුදුන් පමුණුවා ගන්නට විය. එහි ඵලයක් වශයෙන් ජන රංගයට එකී කාර්යය බද්ධ විය. තවද කෝලම් මඩුව අවසාන කොටසේ දී ඉදිරිපත් කරනු ලබන කතා පුවත් අතර සඳ කිඳුරු, මනමේ, ගෝඨයිම්බර වැනි කතා පුවත් ඇත. මෙම කෝලම් කතා පිටපත් ඉතා දියුණු මට්ටමකින් යුක්තය. එනම් සිද්ධි ගැළපීම්, චරිත ශක්තිමත් කිරීම, කාව්‍ය සාහිත්‍යය, රූපණය ආදී වැදගත් වන චරිත සංවර්ධන මූලාශ්‍ර ආදියෙන් ස්වයංපෝෂිත ය. සඳකිඳුරු කතා පුවත උපයෝගී කර ගැනීම වූ කලී බෞද්ධාගමික ආභාසය මෙම කෝලම් නර්තනය කෙරෙහි පැවති බවට තවත් කදිම නිදසුනකි. "සඳකිඳුරුව වූ කලී ස්වාධීන සන්දර්භයක් ඇති පුරාණ බෞද්ධ කවි නාටකයකි. විජයබා පිරිවෙනෙහි උගන්වන ලද්දේ සඳකිඳුරුව වැනි කිවි නළු විය යුතු" බව මාර්ටින් වික්‍රමසිංහයන් ද පවසනුයේ එබැවිනි.(රණවීර,2021,26)

පාස්කු නාට්‍ය නිර්මාණය වන්නේ කතෝලික දහම මුල්කොටගෙන බැවින් ආරම්භයට ප්‍රථම දෙව්මැදුරක මුහුරත් උළෙලක් පවත්වමින් දෙවියන් පුදා පොල්තෙල් පහන් දල්වා ආශිර්වාද ලබා ගැනේ. (පෙරේරා,2000:33) එනයින් බැලූකල ආගමික හා රංගමය වශයෙන් එකිනෙකට වෙනස් වුවද සොකරි, කෝලම්, නාඩගම් හා පාස්කු යනාදී ජන රංග සියල්ලම පාහේ ඔවුන්ගේ ආගමික කාර්යයන් හා තදානුබද්ධව විකාශනය වූ බව විශද වේ.

ඒ මතු නොව මෙම ජන රංගයන් තත්කාලීන සමාජයේ ව්‍යාප්තව පැවති වෘත්තීන්ගේ ස්වභාවය පිළිබිඹු කරවයි. සමකාලීන ජන සමාජයේ ජනයා විසින් නියැලුණු විවිධ වෘත්තීන්හි අන්තර්ගත කාර්යයන්, පීඩනයන් ජන රංගයට උපයෝගී කරගනිමින් සාමූහික අත්දැකීම් බෙදාහදා ගැනීමේ කාර්යය හා තදානුබද්ධ විය. ලංකාවේ පහතරට ප්‍රදේශවල විසූ ජනයා ගොඩ ගොවිතැන හෙවත් හේන් වගාවට යොමු වූ අතර උඩරට ප්‍රදේශවල ජනයා බහුල වශයෙන් මඩ ගොවිතැන හෙවත් කුඹුරු ගොවිතැන කෙරෙහි යොමු විය. සොකරි නට්‍යය බිහිවූ පසුබිම තුල උඩරට ප්‍රදේශයේ ගොවිතැන ප්‍රධාන වෘත්තියක් බවට පත්ව තිබිණ. ඒ අනුව සොකරිය වනාහි ගොවිතැන හා බැඳි රංගයකි. සොකරි නාටකය රඟ දක්වන කාලසීමාව වන්නේ ද අස්වනු නෙළා ගත් පසුව එළඹෙන විවේකීය කාලයයි. සොකරි රංග භූමිය ලෙස යොදාගනු ලබන්නේ ද කමතයි. මෙම රංගයේ දී වී ගෙන ඒම, වී වැනීම, වී කෙටීම, වී පෙලීම වැනි කාර්යයන් අනුකරණාත්මක රංගනයෙන් ඉදිරිපත් කරයි. එමෙන්ම සමාජයේ ව්‍යාප්තව පැවති වඩු වෘත්තීයේ ස්වභාවය ද පිළිබිඹු කරවයි.

> කෝට්ටෙට වඩුවන් හට - ලියුමක් ඇරියෙ එම විට
> ලියුම දැකලා සිට - ආවෙ වඩුවන් නැවක් සැදුමට (දිසානායක,2012:198)

වඩු කර්මාන්තය ප්‍රචලිතව පැවති සමයක එකී ආභාසය රංගය උදෙසා යොදාගත් බව ගම්‍ය වේ. සොකරිය පමණක් නොව මෑත යුගයේ නිර්මාණය වූ චිත්‍රා සෝමපාලයන් විසින් ගායනා කරනු ලබන "උඩරට කඳුකර සිරියා පරදන" ගීතය තේ දළු නෙලන කාන්තාවන්ගේ වෘත්තීය අළලා නිර්මාණය වූවකි. එමෙන්ම කම්මල්කරුවෙකුගේ වෘත්තීය ආශ්‍රිතව නිර්මාණය වූ ගීතයක් ලෙස ජෝ. බී. පෙරේරා විසින් ගායනා කරනු ලබන "මුළු ගතම වෙහෙසුනා දහඩියෙන් නැහැවුනා" ගීතය දැක්විය හැකිය. ඒ අනුව ඕනෑම සමාජයක නිර්මාණ කාර්යය උදෙසා සමාජයීය කාර්යයන් වස්තුබීජ වන බව විද්‍යමාන වේ. සොකරියේ අන්තර්ගත තවත් සුවිශේෂී කර්මාන්තයක් වන්නේ පන්නම් කර්මාන්තයයි. සිංහල ජාතික උරුමය සතු වූ නොඉඳුල් හස්ත කර්මාන්තයක් වූ දුම්බර පැදුරු

කර්මාන්තයෙහි සහජ උරුමක්කරුවන් කින්නර නම් වූ ජන කොට්ඨාසය වෙති. එයිනුත් සුවිශේෂ වන්නේ උඩරට දුම්බර මිටියාවතෙහි වෙසෙන කින්නර කුලයේ දුම්බර පැදුරු ය.(කාවින්දයා,2022:09) විවේකයක් ලද අවස්ථාවක ලාංකේය ජන සමාජයේ කාන්තාව පන්නම් කර්මාන්තයේ නිරතවීම සම්ප්‍රදායකි. එමෙන්ම අතීතයේ දී පන්කම් නොදත් ළිය විවාහයකට පවා නුසුදුසු බව ජන සම්මත පිළිගැනීම විය. සොකරියේ දී පන්නම් කර්මාන්තයේ නියැලීමේ වෘත්තිමය පියවර කවි ගායනා හා අනුරූපණ මගින් ඉදිරිපත් කරයි. එබැවින් සොකරියට පන් කර්මාන්තය ඇතුළත් කරගැනීම වූ කලී එක් පසෙකින් ව්‍යංගාර්ථ දැනවීම සහ අනෙක් පසින් වෘත්තීයමය අවබෝධයක් ලබාදීමට බව නිගමනය කළ හැකිය. සොකරි ගැමි නාටකයේ වෙද රාළගේ චරිතය නිර්මාණකරණය උදෙසා සමකාලීන සමාජයේ දේශීය වෛද්‍ය වෘත්තියේ ආභාසය ලබාගනියි. තත්කාලීනව දේශීය වෛද්‍ය වෘත්තියේ පැවති ඇතැම් අඩුලුහුඩුතා මෙන්ම සුවිශේෂතා ද චරිතය උදෙසා තදානුබද්ධ කරගත් බවට තර්ක කළ හැකිය. තවද සොකරියේ අන්තර්ගත තැපැල් පියුම්ගේ චරිතය ලියුම් බෙදන්නෙකුගේ වෘත්තීමය ගති ලක්ෂණ ජන රංගයට තදානුබද්ධ කරගත් අවස්ථාවකි. පුරාණ තැපල් බෙදන්නා ගමින් ගමට ගමන් කළේ පා ගමනිනි. ඔහුගේ අතෙහි දිගු පොල්ලක් වන අතර යථාර්ථ වෘත්තීයේ දී එය භාවිත කරනු ලැබූයේ තැපැල්කරුවාගේ ආරක්ෂාවටයි.

කෝලම් ජන රංගය මඟින් සමාජයේ පවත්නා වෘත්තීයයන් රංගනය සඳහා ප්‍රස්තුත බවට පත්කරගෙන ඇත. නොයෙක් අවස්ථාවන්වලදී කෝළම් රංගයට නවාංග රාශියක් එක් විය. විවිධ කාල පරිච්ඡේදයන්හි දී සමාජය මුහුණ දුන් සංසිද්ධීන් ඊට බලපෑ ප්‍රධානතම සාධකයකි. අණබෙරකරු කෝලමේ පාත්‍ර වර්ගයකි. වැඩවසම් සමාජ ක්‍රමය පැවති යුගයේ දී බොහෝවිට රාජකාරි කටයුතු සඳහා සන්නිවේදනය සිදු කෙරුණේ අණබෙර මගිනි. එබැවින් අණබෙර වෘත්තීය කෝලමේ ප්‍රස්තුතයක් බවට පත්වීම මගින් ජන රංගය වනාහි සමාජ කාර්යය සමග තදානුබද්ධව විකාශනය වන්නක් බව විශද වේ. එමෙන්ම යුධ සේවාව ඇත අතීතයේ දී මෙරට තිබූ තවත් වෘත්තියකි. ඇතැම්විට යුද්ධයට ගියවිට සොල්දාදුවන් නැවත පැමිණෙන්නේ තුවාල ද සහිතව ය. මෙමගින් එකී කටුක දිවි පැවැත්ම නිරූපණය කරයි. යටත් විජිතකරණයෙන් පසුව සමාජ ගත වූ රාජ්‍ය සේවා අතර පොලිස් සේවය විය. නිර්මාණකරුවා විසින් සමකාලීන සමාජයේ පොලීසිය පිළිබඳ තමන් දුටු දෑ ඇසූ දෑ මගින් පොලිස් කෝලම නිර්මාණය කරගන්නා ලදී. ඒ වූ කලී කෝලම් රංගයේ පාත්‍ර වර්ගයා සමාජ නිරීක්ෂණය කිරීමේ ඵලය මතින් නිර්මාණය වූ අවස්ථාවකි. ඒ මතු නොව රදළ වැඩවසම් ක්‍රමයේ දී ආරච්චි තනතුර ප්‍රධාන වෘත්තියයක් විය. මෙම ආරච්චි කෙරෙහි පැවති සමාජ දෘෂ්ටිකෝණය කෝලම් රංගය මගින් නිරූපණය කරයි.

නිදසුන් ලෙස
නාසා දුප්පත් හැම - අසාධාරණ කරයි මෙලෙසට (කස්තුරිආරච්චි, 2008: 04)

ජේඩි හෙවත් ජස කෝලම නිර්මාණය වන්නේ වැඩවසම් සමාජයේ කුල ක්‍රමය මත පදනම්ව ය. ජසයා හේන කුලයට අයත් වන අතර සමකාලීන සමාජයේ ඔවුනට හිමි සමාජයීය තත්ත්වය පවා ජස කෝලම නිර්මාණය කිරීම උදෙසා උපයෝගී කරගෙන ඇත. සමකාලීන සමාජයේ හේනයන්ගේ කාර්යය වූයේ රෙදි ඇපිල්ලීම බව මෙමගින් නිරූපණය වේ. කෝලම්හි අන්තර්ගත අප්පුවරු/ කුමතේරු අප්පු නම් වූ චරිතයක් ද කොමසාරිස් නැතහොත් පරීක්ෂක යන තේරුම ඇතිව රංගගත වීම සමාජයීය වෘත්තීන්ගේ ආභාසය ලබාගැනීමයි. කෝලම් රංගය ව්‍යාප්තව පවතින්නේ මුහුදුබඩ ප්‍රදේශ ආශ්‍රිතව බැවින්

ඔවුන්ගේ ප්‍රධාන වෘත්තිය වන ධීවර කර්මාන්තය ධීවරයා චරිතය නිර්මාණයට පදනම්ව ඇති බවට නිගමනය කළ හැකිය.

ජන රංගය වරෙක ආගමික ප්‍රචාරක මාධ්‍යයක් වශයෙන් ද සමාජ කාර්යයන් හා තදානුබද්ධව ඇත. ඒවායෙහි මුඛ්‍ය පරමාර්ථය විනෝදාස්වාදය වුවද ආගමික සංකල්ප ප්‍රචාරය කිරීම උදෙසා ජන රංගය වරෙක මහෝපකාරී විය. නිදසුන් ලෙස කවි නාඩගමේ දී දක්වන සඳකිඳුරු, මනමේ මෙන්ම මහාපදුම ජාතකය, චුල්ලපදුම ජාතකය, වෙස්සන්තර ජාතකය, සම්බුලා ආදී කතා පුවත් මගින් බොහෝවිට තෙරුවන් නමස්කාරය, පුනරුත්පත්ති විවරණය, කර්ම විපාක, ජාතක කතා යනාදිය සමාජයට සම්ප්‍රේෂණය කිරීමේ මාධ්‍යයක් වශයෙන් ක්‍රියා කරයි. ඒ මතු නොව කවි නාඩගම පවත්වනු ලැබුවේ ද වෙසක් පොසොන් ඇසළ පොහොය බණ, පිරිත් පින්කම් ආදී ආගමික අවස්ථාවන්හි දී වීම ම ජන රංගය ආගමික ප්‍රවාහය හා ඒකාත්මික වීමකි. එමෙන්ම බයිබලයේ පුරාණ ගිවිසුමේ මෙන්ම නව ගිවිසුමේ කතා පාස්කු ජන රංගය උදෙසා තේමාවී ඇත. මේවායේ ක්‍රිස්තුස් වහන්සේ ජෙරුසලම බලා පිටත්වීම, මවගෙන් අවසර ගැනීම යනාදී කතා ප්‍රවෘත්ති අන්තර්ගත ය. පෘතුග්‍රීසීන් මෙරට යටත් විජිතයක් බවට පත්කර ගැනීමෙන් පසු ඔවුන්ගේ සිරිත් විරිත්, ආගම මෙරට ප්‍රචලිත කිරීමට මහත් වෙහෙසක් දැරීය. ඔවුන්ගේ භාෂාව ලාංකිකයන්ට නුපුරුදු බැවින් ධර්ම ප්‍රචාරක කටයුතු පිණිස නාට්‍ය උපයෝගී කොටගත්හ. එබැවින් ධර්ම ප්‍රචාරය කිරීමේ සමාජයීය කාර්යය හා ඒකාබද්ධ වෙමින් මෙම ජන රංගයන් විකාශයට පත්ව ඇති බව විද්‍යමාන වේ.

ජන රංග කලාකරුවෝ සමකාලීන සමාජය තුළ තිබූ ගැටුම්කාරී අවස්ථා අධ්‍යයනය කරමින් එකී අනුභූතීන් ජන රංගය මඟින් විවරණය කරමින් සමාජය ඥානනය කිරීමේ කාර්යයෙහි නිරතවිය. සොකරිය මඟින් නිරූපණය කරන්නේ සමාජ සංස්ථාවේ අර්බුදකාරී අවස්ථාවකි. ඒ වනාහී නොගැළපෙන විවාහයක්  සිදුකර ගැනීම නිසා කුටුම්භයෙහි ඇතිවන ලිංගිකමය ගැටළුකාරි තත්වයන්, පරදාර සේවනය සහ දරුවන් නොමැති වීමයි. දරුවන් නොමැතිවීම මගින් නූතනයේ පවා කාන්තාව සුවිසල් අර්බුදයකට මුහුණ පාන්නීය. ගුරුහාමි සොකරියට සාපේක්ෂව මහළු මිනිසෙකි. එහෙයින්ම ඇයගේ රති පවස සන්තෘප්ත කරලීමට ඔහුට නොහැකි වූවා විය හැකිය. අවශ්‍යතාවය පූරණය කරගනු වස් ඇය වෙදරාළ සමඟ පලා යන්නීය. පරයා අවස්ථාවෝචිතව සොකරියට බලපෑම් කරයි. පූර්වෝක්ත සඳහන් සමාජයීය ගැටලු පොදු වේදිකාවකට ගෙනැවිත් ඒවායෙහි සාධනීය නිශේධනීය ඵලයන් මගින් සමාජය ඥානනය කිරීමේ කාර්යය ජන රංගය මගින් සිදුකරයි. කෝලම්හි අන්තර්ගත ජස ලෙන්චිනා රංගය මගින් මානව වර්ගයා මුහුණපානු ලබන තවත් එක් සමාජ ගැටලුවක් පිළිබිඹු කරවයි. ඒ වූ කලී  නොගැළපෙන විවාහය මගින් ගම්‍යවන ගැටලු මෙන්ම බහුභාර්යා සබඳතා මඟින් ඇතිවන සමාජයීය ගැටලුය. ඒ අනුව නූතනයේ මෙන් මානවයාගේ තොරතුරු දැනගැනීමේ වපසරිය දියුණු නොවූ අවධියක නූතනයේ  සිදුකරනු ලබන පවුල් උපදේශන සේවාව අතීතයේ දී මෙම ගැමි නාටක මගින් සිදු වූ බව විශද වේ. ප්‍රභූ පැළැන්තියෙන් බට කෑ මිනිසා සිය ආවේග මුදා හැරීමේ සියුම් උපක්‍රමයක් ලෙස කෝලම් රංගය උපයෝගී කරගත් බවට නිසැකය. ආරච්චි කෝලම ඊට නිදසුන්ය. මෙමගින් විවිධ සමාජ විෂමාචාර උපහාසයට ලක්කෙරේ. විවාහක ස්ත්‍රියකගේ අනියම් සබඳතාවය ලෙන්චිනා චරිතය මගින් ගෙනහැර දක්වන අතර සමකාලීන සමාජයේ පගාව ලබා ගැනීම ආරච්චි කෝලමෙන් නිරූපණය කරයි. එය අතීතයේ පමණක් නොව නූතන සමාජයේ පවා දක්නට ලැබෙන අකටයුත්තකි. සිය බලය අනිසි ලෙස භාවිත කිරීම සම්බන්ධයෙන් පොලිස් කෝලම නිරූපණය කරයි. සමාජයේ පැවති එවන් විෂමතාවයන් අන්තර්ග්‍රහණය කර ගනිමින් සංවාදයට භාජනය කරමින් සමාජය ඥානනය කිරීමේ

කාර්යය ජන රංගය මගින් සිදුවිණ. ඊට අමතරව කවි නාඩගම් සහ පාස්කුව මගින් ඒ ඒ ආගමික සම්ප්‍රදායන් පිළිබඳ දැනුම සමාජගත කිරීමේ ක්‍රියාවලිය සිදුකෙරිණ.

උක්ත සියලු රංග ශෛලීන් හි මූලික අභිප්‍රායක් වන්නේ සමාජ ඒකාබද්ධතාවය, සහජීවනය ඇති කරලීම සහ විනෝදාස්වාදය ලබාදීම යනාදී සමාජයීය කාර්යයන් හා ඒකාත්මික වීමය. කෝලම්, සොකරි, නාඩගම්, කවි නාඩගම්, පාස්කුව දමිල කුත්තුව යනාදී සියලුම රංග කාර්යයන් සිදුකරනු ලබන්නේ සාමූහික සජීවී ප්‍රේක්ෂක පිරිසක් ඉදිරියේ ය. ගමේ සියල්ලන්ම පාහේ රංගය නැරඹීම සඳහා එක්වෙති. කුල මල ජාති ආගම් භේදයකින් තොරවම ඔවුහු විනෝදාස්වාදය ලබා ගනිති. හිත් අමනාපකම් තිබුණ ද කෝලමක්, සොකරියක් නරඹන විට සියල්ලෝම සුහද අල්ලාප සල්ලාපයේ නිරත වන බැවින් එකී හිත් අමනාපකම් පහව යයි. සියල්ලන්ම එක්වී පත්‍රයන්ට අවශ්‍ය දෑ සොයාබලා සිදුකර දීම, රාත්‍රියේ පහන් දැල්වීමට අවශ්‍ය වන තෙල් සෑම නිවසකින්ම පාහේ හැකි පමණින් ගෙනඒම, ගමේ නිවෙස්වල පවත්නා පැදුරු රැස් කිරීම, තම ශක්ති මට්ටමින් කැවිලි සෑදීම සඳහා දායක වීම යනාදී සමාජීය කාර්යයන් ඔස්සේ සමාජ සහජීවනය සහ ඒකාබද්ධතාවය ඇති කරවයි. පාස්කු නාට්‍ය ආරම්භ කිරීමට මත්තෙන් පාස්කු මඩුව ඉදි කිරීමට ගම්වාසීන්ගෙන් සහයෝගය ලබාගනියි. ගම තුළ එම පණිවිඩය රැගෙන යන්නේ කුඩා දරු දැරියන් විසිනි. ඔවුහු මහත් ප්‍රබෝධයකින් එකී කටයුත්තේ නියැළෙති. ඒ වනාහී ජන රංගය ඕනෑම පුද්ගල තරාතිරමක් හා ඒකාබද්ධ වෙමින් ගොඩනැගෙන කලාවක් වන බවයි. දෙමළ ජනයා අතර රඟ දක්වන නාටක විශේෂයක් වන දමිළ කුත්තුව වෘත්තාකාර සභාවක සජීවී ප්‍රේක්ෂක පිරිසක් ඉදිරියේ රඟ දක්වයි. එබැවින් මෙම ජන රංගය ද පූර්ව සඳහන් කළ පරිදිම සාමාජීය සහසම්බන්ධතාවය, සහජීවනය ඇති කරලීම උදෙසා ඉවහල් වේ. අනෙකුත් අවශේෂ ජන රංගයන්ට සාපේක්ෂව පාස්කු නාට්‍යයෙහි ඇති සුවිශේෂිත්වයක් වන්නේ එය සමාජ ආර්ථික ප්‍රවාහය හා තදානුබද්ධ වීමයි. ඒ වනාහී පාස්කු සමයේ මුළු නගරයම කෙළි බිමක සිරි ගන්නා අතර ජනතාව කුඩා සාප්පු ඉදිකර ගනිමින් නරඹන්නන් සඳහා සරුවත්, කඩල, අච්චාරු ජප මාලා යනාදිය සාධාරණ මිලකට අලෙවි කර ගනිමින් ආර්ථික ශක්තියක් අත්පත් කර ගැනීමයි.

ජන සමාජයේ ව්‍යාප්තව පැවති ඇදහිලි විශ්වාස අනුසරින් ජනරංගය විකාශනය විය. සමස්තයක් ලෙස ජන විශ්වාස දේව හා යක්ෂ ලෙස වර්ග කල හැකිය. ලාංකේය ජන සමාජය ප්‍රාග් බෞද්ධ සමයේ සිටම දේව යක්ෂ ඇදහිලි, පුද පූජා පැවැත්වූ බවට සාහිත්‍ය මූලාශ්‍රයෝ සාක්ෂි දරති. සොකරියේ පත්තිනි දේවතාවිය මුල්කරගත් ඇදහිලි හා විශ්වාස අන්තර්ගතය. නූතන සමාජයේ පවා දරුවන් පතා පත්තිනි දේවියට භාරහාර වීම සම්ප්‍රදායකි. ලාංකේය ජන සමාජයේ යහපත් ප්‍රතිඵල සුබ නිමිති වශයෙනුත් අයහපත් ප්‍රතිඵල අසුබ නිමිති වශයෙන් සලකයි. සොකරි ජන රංගයේදී සොකරිය, ගුරුහාමි සහ පරයා යන තිදෙනාම නැව් නැගීමට සැරසෙන අවස්ථාවේ පසුබිමෙන් කිවිසුම් හඬක් ඇසීම නිසා බාධා වූ බව පවසා නිමිති බලා ගමන පිටත් වෙයි. එකී සංසිද්ධිය මගින් සමකාලීන සමාජ විශ්වාසයන් පෙරදැරි කොට ගනිමින් ජන රංගය නිර්මාණය වී ඇති බව ගම්‍ය වේ. නූතන සමාජයේ පවා ඕනෑම සුබ කටයුත්තකට පොරොතුව නිමිති බැලීමේ සම්ප්‍රදායක් ඇත. තමාගේ ඇසට පෙනෙන හෝ සිදුවෙන සිද්ධීන් අනුව ඉදිරියේදී සිදුවිය හැකි ප්‍රතිඵල නිගමනය කිරීමේ ශාස්ත්‍රය නිමිති ශාස්ත්‍රය යි. පෙර නිමිති, පෙර මග නිමිති, කැට නිමිති, ශබ්ද නිමිති, බාධක නිමිති, ආකාස්මික නිමිති යනුවෙන් නිමිති වර්ගකර දක්වා ඇත.(බණ්ඩාර,2018:105) ජන ඇදහිලි හා විශ්වාස වූ කලී සමාජ බද්ධ කාර්යයන්ය. කෝලම් රංගයේ දී සමකාලීන සමාජයේ අතිමානුෂීය විශ්වාසයන්ගේ ආභාසය නිරූපණය වේ. නාගරාක්ෂ, ගුරුළු රාක්ෂ, ගිනිජල් රාක්ෂ යනාදී අතිමානුෂීය චරිත රාශියක් කෝලම්හි

අන්තර්ගතය. එබැවින් එක් පසෙකින් සමාජ විශ්වාසයන්ගේ ආභාසය ඒකාබද්ධ වන අතර අනෙක් පසින් ප්‍රේක්ෂක භාව විශෝධනය සිදුකරයි. කෝලම් අවසානයේ දී වස්දොස් හැරීමකි. වස් දොස් හැරීම සිංහල ජන සම්ප්‍රදායකි. එනම් සිංහල සාම්ප්‍රදායික විවාහයකදී නම් නව යුවළගේ වස් දොස් හැරීම, නව නිවසකට ගෙවැදීමේ දී එම නිවසේ වස් දොස් හැරීම, දියණියක් වැඩිවියට පත්වීමේ දී ඇයගේ වස්දොස් හැරීම, බුද්ධ ප්‍රතිමා නිර්මාණ කලාවේ නේත්‍රා මංගල්‍යයේදී වස්දොස් හැරීම යනාදී වශයෙන් සමාජයේ විවිධ අවස්ථාවන්හිදී වස්දොස් හැරීමේ ක්‍රියාවලිය සිදු කරනු ලබයි.

යටත්විජිතකරණය, ධනපතිවාදය, යුද්ධය යනාදී සමාජ විපර්යාසයන් සමග රංග කලාව වෙනස්වීම්වලට බඳුන් විය. සොකරි රංගයේ කතා ප්‍රස්තුතයේ ඉන්දියානු දමිළ ආභාෂයක් අන්තර්ගත වීම සහ උඩරට පළාත කේන්ද්‍රකොට නිර්මාණය වීම මගින් සමකාලීන දේශපාලන පරිසරයේ බලපෑම පිළිබිඹු කරවන බවට තර්ක කළ හැකිය. මක්නිසාද යත් මහනුවර පාලන තන්ත්‍රය නායක්කර් පාලනයට නතු වීම මත හින්දු ආභාසය නිසැකවම ව්‍යාප්ත වන්නට ඇත. ඒ අනුසරින් සොකරියට දමිළ භාෂාව සහ බ්‍රාහ්මණ ස්වරූප අන්තර්ගත වූ බවට අනුමාන කළ හැකිය. කෝලම් රංගය ව්‍යාප්ත වන්නේ මුහුදුබඩ ප්‍රදේශවල බැවින් යටත්විජිතකරණයේ බලපෑම මෙන්ම දෙමළ, මුස්ලිම් ව්‍යාපාරිකයන්ගෙන් සූරාකෑම්වලට ද නතුවිය. එකී සමාජමය සංසිද්ධි හා තදානුබද්ධ වෙමින් කාලානුරූපීව කෝලම් රංගයට නවාංග එක්විණ. ඒ අනුව යටත් විජිත සමයේ අලුතින් ඇතිවූ රාජ්‍ය සේවාවන් යටතට පොලිසිය ද එක්විය. පොලිසිය මගින් සිදුවන අකටයුතුකම්, අසාධාරණය පොලිස් කෝලම මගින් සූක්ෂමව උපහාසයට ලක්කරයි. ලන්දේසි කෝලම ලන්දේසි ඇවතුම් පැවතුම් මගින් නිර්මාණය කරගෙන ඇත. කරපිට කෝලම මගින් යටත් විජිත පාලනය සියුම්ව උපහාසයට ලක්කරයි. කාපිරි කෝලම අධිරාජ්‍යවාදීන් විසින් මෙරටට ගෙන්වනු ලැබූ කාපිරි මිනිසුන් සම්බන්ධව නිර්මාණය කර ඇත.

1970 දශකයේ ලාංකේය සමාජ දේශපාලනික හා ආර්ථික අර්බුද හමුවේ මිනිසුන් මුහුණ දුන් කටුක අත්දැකීම් විවරණය කරමින් වීදි නාට්‍ය නමැති ජන රංග කලාව බිහි විය. "උතුමාණන් නැවත පැමිණේ, ඔබ දුටුවා, වෙන්දේසිය, රටේ දැක්ම" යනාදි වීදි නාට්‍ය මගින් සමකාලීන ජන සමාජයේ ප්‍රශ්න ගැටුම්කාරී අවස්ථා පිළිබිඹු කරන ලදී. **පරවියෙක් දැක්ක කල්** වීදි නාට්‍ය සමගිය මුල්කොට ගනිමින් නිර්මාණය වී ඇත. එප්පාවල පොස්පේට් නිධිය සම්බන්ධව නිර්මාණය කරන ලද **උරුමය** වීදි නාට්‍යය පරාරිසරික ගැටලුවක් ආශ්‍රයෙන් නිර්මිත ය. තවද ජන රංග කලාවේ නූතන ප්‍රවේශයක් ලෙස සමාජ කාර්යය හා බද්ධ වෙමින් ගොඩනැගුණු **ජන රංග සභාව** නම් විකල්ප නාට්‍ය ක්‍රමය සුවිශේෂීය. ලාංකේය ග්‍රාමීය ප්‍රදේශවල ජනයා සහභාගි කරවාගනිමින් ප්‍රජා මූලික විකල්ප නාට්‍ය ක්‍රමයක් ගොඩ නැගීමට වෑයම් කළ රංග කණ්ඩායමක් ලෙස ජන රංග සභාව හැඳින්විය හැකිය.(සේනානායක,2015:133)මෙය ජන සභා රංගය නමින් හඳුන්වයි. මෙම රංගයේ දී දේශීය ශාන්තිකර්මවල ඇතුළත් නාට්‍යමය පෙළපාලි, සන්නි ආදියෙහි ඇති ප්‍රේක්ෂක නළු සබඳතා, ප්‍රේක්ෂකාගාරය හා රංගය විභේදනය වන අවස්ථා, ගැටලුවලට ප්‍රේක්ෂකාගාරය සම්බන්ධ කරගන්නා අවස්ථා ආදර්ශයට ගනිමින් ජන සභා රංගය නිර්මාණය කරගෙන තිබේ. ප්‍රජාවට බලපාන ගැටලු විසඳා ගැනීමට ගමෙහි ක්‍රියාත්මක වූ ගම් සභාව අනුසරින් එකට එකතු වී සාකච්ඡා මාර්ගයෙන් තීරණ වලට එළඹීමේ ක්‍රමය ජන සභා රංගය විසින් අනුගමනය කරයි. ජනරංගය ක්‍රමික සමාජ පරිණාමන ක්‍රියාවලියේ දී කාලානුක්‍රමිකව නූතන වෙනස්වීම්වලට බඳුන් වෙයි. නිදසුන් ලෙස 2002 වසරේ දී පැවැත්වූ කෝලම් රඟදැක්වීමක දී අණබෙරකරුගේ සංවාදය දෙස විචාරාක්ෂිය යොමු

කිරීමේ දී නූතන කැලිකසල බැහැර කිරීමේ ප්‍රශ්නය ඒ සඳහා උපයෝගී කරගෙන ඇති බැව් විශද වේ.

කාරියකරවන රාළ - බැද්දෙ තියෙන කුණු පාරට දාලා?
පනික්කිලේ - පාරෙ තියෙන කුණු බැද්දට දාලා
කාරියකරවන රාළ - ඇයි වදේ ඒ මොකක්ද ඒ අස්කිරිල්ල. එහෙම නෙවෙයි පණික්කිලේ එහෙම නෙවෙයි... (අමරසේකරල2014.08)

මීට අමතරව නූතන සමාජ කාර්ය හා බද්ධ වෙමින් 2020 වසරේ දී එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදලේ අනුග්‍රහය මත ලැජ්ජා කෝලම ජනගත කරන ලදී. සාම්ප්‍රදායික කෝලම් මඩුවක සාම්ප්‍රදායික චරිත වන වෙදරාළ සහ පොලිස් කෝලම භාවිත කරමින් ඊට අමතරව ආමසියක චරිතයක් හා තරුණයකුගේ චරිතයක් සම්ප්‍රදායට අනුකූල බෙරපද හා සම්මිශ්‍ර කරගනිමින් නූතන තරුණ ප්‍රජාවට ලිංගික අධ්‍යාපනය ලබාදීමේ අභිප්‍රාය පෙරදැරිව නිර්මිතය. එහිදී ලිංගික සතුට, දරුවන් අතර පරතරය, අනවශ්‍ය ගැබ් ගැනීම් වලක්වාගැනීම මෙන්ම ලිංගිකව සම්ප්‍රේෂණය වන ආසාදන වලින් ආරක්ෂාව සඳහාත් ඉතා වැදගත් නූතන ක්‍රමවේද පිළිබඳව සමාජය ඥානනය කරනු ලබයි. එය කෝලම් රංග කලාව සමාජ කාර්යය හා තදානුබද්ධ කරගත් නූතන ප්‍රවණතාවයකි. එමෙන්ම 2021 වර්ෂයේ දී අරකවිල නර්තන හා නාට්‍ය පදනම මගින් පොල්බෑ කෝලම නමින් පොල් ආශ්‍රිත සමාජ ප්‍රශ්නයක් විග්‍රහ කරමින් කෝලම් රංගයක් නිර්මාණය කරන ලදී. මේ අයුරින් ජන රංගය නූතනයේ සමාජ කාර්යයන් හා බද්ධ වෙමින් නවමු මානයන් කරා පැමිණ ඇත.

**නිගමනය**

ඒ අනුව තත්කාලීන ජන සමාජයන්හි සමාජ කාර්යයන් හා තදානුබද්ධ වෙමින් මානව සමූහයා ඥානනය කිරීමේ කාර්යය මෙම ජන රංග මගින් සිදුවූ කෘත්‍යාත්මක මෙහෙවරක් බව නිගමනය කළ හැකිය. තවද මහජන සම්බන්ධතා ගොඩනැගීමේ දී සහ මහජන සන්නිවේදනයේ දී ශ්‍රව්‍ය හා දෘශ්‍ය මාධ්‍ය යොදා ගැනීම මගින් එම පණිවිඩය වඩාත් සාර්ථකව සන්නිවේදනය කළ හැකිය. එකී ක්‍රමවේදය මෙම ජනරංගයන් උදෙසා උපයෝගිත බව විශද වේ. පූර්වෝක්ත සියලු කරුණු දෙස විචාරාක්ෂිය යොමු කිරීමේ දී ජන රංගකලාව වූ කලී සමාජයීය, සංස්කෘතික, ආගමික, දේශපාලනික හා ආර්ථික ප්‍රවාහයන් ඔස්සේ කාලානුරූපීව සමාජ කාර්යයන් හා බද්ධ වෙමින් පරිණාමය වෙමින් නවාංග එක් වෙමින්, වැඩුණු කලාංගයක් බවත් ප්‍රේක්ෂකයා ආනන්දයෙන් ප්‍රඥාව කරා රැගෙන යන කලා මාධ්‍යයක් වන බවත් නිගමනය කළ හැකිය.

**ආශ්‍රිත ග්‍රන්ථ**

අමරසේකර, කේ.ජී. (2014) කෝලම් නාටක චරිත, කොළඹ : ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

කාවින්ද්‍යා, ගයත්‍රී. (2022), පැදුර සහ හෙළ සංස්කෘතික උරුමය, නුගේගොඩ: කර්තෘ ප්‍රකාශන

දිසානායක, මුදියන්සේ. (2012), සිංහල නර්තන කලාව, කොළඹ : ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

දිසානායක, මුදියන්සේ. (2009), සොකරි සහ කවි නාඩගම, කොළඹ : ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

පෙරේරා,ජූඩ් සිසිර. (2000), පාස්කු නාට්‍ය කලාව, කොට්ටාව : සාර ප්‍රකාශන.

බණ්ඩාර, ඊ.කේ.හේමතිලක. (2018), සංකල්ප හා බැඳුණු ජනශ්‍රැතිය (සමාජ විද්‍යාත්මක විමර්ශනයකි) ගනේමුල්ල : නිශාන්ත ප්‍රකාශකයෝ.

සුරවීර.ඒ.වී. (1987), කලාව යනු කුමක්ද, රාජගිරිය : කුරුළු ප්‍රකාශකයෝ.

සේනානායක, මංගල. (2015) ශ්‍රී ලාංකේය විකල්ප නාට්‍ය කලාවේ ප්‍රවණතා, නුගේගොඩ : සරසවි ප්‍රකාශකයෝ.

රණවීර, බුද්ධික. (2012) කෝලම් නාට්‍ය සම්ප්‍රදාය, නුගේගොඩ : ශ්‍රී ලංකා කලා මණ්ඩලය.